ස්කයිලයින් පැසිෆික් රියල් එස්ටේට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් ඒකාබද්ධ කිරීම අනුමත කිරීමේ යෝජනා සම්මත ලෙස පනතේ 242 (4) වන වගන්තිය යටතේ සලකනු ලබන ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් සමාගමේ යම් කොටස් හිමියකු හෝ ණය හිමියකු හෝ සමාගම් බැඳීමක් ඇති කරගෙන සිටින යම් තැනැත්තෙකු හෝ විසින් පරීක්ෂා කිරීම පිණිස සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි දී සමාගමේ ලේකම්වරුන් ගේ කාර්යාලයේ දී, එනම් කොළඹ 11, බංගසාල වීදියේ අංක 120 1/1 දරන ස්ථානයේ කෝපරේට් ඩී සොලියුෂියෝ (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් ලබාගත හැකි ය.

සමාගමට ඉල්ලීමක් කිරීමෙන්, සමාගමේ කොටස්හිමියෙකුට හෝ ණයහිමියකුට හෝ සමාගම බැඳීමක් ඇතිකර ගෙන සිටින යම් තැනැත්තකුට හෝ ගාස්තු අය කිරීමකින් තොරව ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය.

ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි, කෝපරේට් ඩී සොලියුෂියෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ලේකම්වරු.
2015ක් වූ මාර්තු මස 31 වැනි දින දී ය.
04-765

ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වන වගන්තිය අනුව ස්කයිලයින් පැසිෆික් රියල් එස්ටේට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි අංක පීවී 14771) ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් ලියාපදිංචි අංක පී වී 21216) සමග වූ යෝජිත ඒකාබද්ධ කිරීමක් සම්බන්ධයෙන් පනතේ 242 වන වගන්තියේ (3) (අා) උප වගන්තිය ප්‍රකාර කෙරෙන ප්‍රසිද්ධ දැන්වීම.

ස්කයිලයින් පැසිෆික් රියල් එස්ටේට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමට සම්පූර්ණයෙන් අයත් පාලිත සමාගමක් වන ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ස්කයිලයින් පැසිෆික් රියල් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, වර්ෂ 2015 ක් වූ මාර්තු මස 23 වැනි දින, ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ් සමාගම, ස්කයිලයින් පැසිෆික් රියල් එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සමග, සමාගම් පනතේ 242 (1) වන වගන්තිය යටතේ ඒකාබද්ධ කිරීමට යෝජනා සම්මතයක් කරන ලදී. එමගින් ස්කයිලයින් පැසිෆික් රියල් එස්ටේට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම පවතින අතර ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ පැවැත්ම අවසන් වනු ඇත.

මේ දැන්වීමේ දින සිට දවස් 20 ට අඩු නොවන දිනයක දී ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ස්කයිලයින් පැසිෆික් රියල් එස්ටේට් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඒකාබද්ධ කිරීමේ යෝජනාව සමග පනතේ 243 වන වගන්තියෙහි සඳහන් ලේඛන ලියාපදිංචි කිරීම සඳහා යොමු කිරීම මත සමාගම් පනතේ 244(1) වන වගන්තිය ප්‍රකාර ඒකාබද්ධ කිරීමේ සහතිකය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කළ විට ඒකාබද්ධ කිරීම බලාත්මක වනු ඇත.

ස්කයිලයින් පැසිෆික් රියල් එස්ටේට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් ඒකාබද්ධ කිරීම අනුමත කිරීමේ යෝජනා සම්මත ලෙස පනතේ 242 (4) වන වගන්තිය යටතේ සලකනු ලබන ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් සමාගමේ යම් කොටස් හිමියකු හෝ ණය හිමියකු හෝ සමාගම් බැඳීමක් ඇති කරගෙන සිටින යම් තැනැත්තෙකු හෝ විසින් පරීක්ෂා කිරීම පිණිස සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි දී සමාගමේ ලේකම්වරුන් ගේ කාර්යාලයේ දී, එනම් කොළඹ 11, බංගසාල වීදියේ අංක 120 1/1 දරන ස්ථානයේ කෝපරේට් ඩී සොලියුෂියෝ (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් ලබාගත හැකි ය.

සමාගමට ඉල්ලීමක් කිරීමෙන්, සමාගමේ කොටස්හිමියෙකුට හෝ ණයහිමියකුට හෝ සමාගම බැඳීමක් ඇති කර ගෙන සිටින යම් තැනැත්තකුට හෝ ගාස්තු අය කිරීමකින් තොරව ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය.

ස්කයිලයින් පැසිෆික් හෝම්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි, කෝපරේට් ඩී සොලියුෂියෝ (ප්‍රයිවට්) ලිමිටඩ් ලේකම්වරු.
2015 ක් වූ මාර්තු මස 31 වැනි දින දී ය.
04-766

ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙහි පහත සඳහන් ඇටෝර්නි බලපත්‍රයෙහි ඇටෝර්නි අධිපති වන කඩුවෙල, හේවාගම, බෲක්වත්ත අංක 115/ඒ/1/3 හි පදිංචි නස්නාරං පට්ටියගේ සිරියලතා සිල්වා වන මා විසින් මාගේ ඇටෝර්නි බලකාරිය ලෙස කඩුවෙල, හේවාගම, බෲක්වත්ත අංක 115/ඒ/1/3 හි පදිංචි වේල්ගමගේ සඳිකා ප්‍රියදර්ශණී පෙරේරා යන අය පත්කරමින් ප්‍රේමිනාත් සී. දොලෙවත්ත ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් ලියා සහතික කල අංක 588 සහ 2014.08.24 දින දරන බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ දිනපොත් අංක 8895 යටතේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 125 වන කාණ්ඩයේ 22 වන පත්තරුවේ ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රයෙන් මා විසින් දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කරන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

ඇන්. පී. සිරියලතා.

04-775

නිවේදනයයි

ලෙක්ස් එෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් 2015.03.26 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.
සමාගමේ අංකය : PV 104771
ලියාපදිංචි කාර්යාලය : අංක 83, බලගොල්ල, කෙන්ගල්ල.
04-776

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නාමය : ඒ - නෙට්වර්ක් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 104360
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 28, ඒ 5 වැනි පටුමග, කොළඹ 03
සංස්ථාගත කළ දිනය : 2015 මාර්තු මස 11 වැනි දින.

සමාගමේ ලේකම්.

04- 800

ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.
සමාගමේ නම : වෙල්නස් ලයිෆ් සයන්සස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 104695
ලියාපදිංචි ලිපිනය : අංක 1143/44, ලියනගොඩ පාර, කටුකුරුන්ද, පන්නිපිටිය
සංස්ථාගත කිරීමේ දිනය : 2015 මාර්තු 24

සමාගම් ලේකම්.

04-801

සමාගම් සංස්ථාපනය කිරීමේ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය
සමාගමේ නම : ලීඕරා ඉන්වෙස්ට්ස් (ප්‍රයිවට්) ලිමටඩ්

සමාගම් අංකය : පීවී 69368
ලියාපදිංචි කාර්යාලය : අංක 424, යුනියන් පෙදෙස, කොළඹ 02
සමාගමේ නම : කජු ට්‍රී (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 103505
ලියාපදිංචි කාර්යාලය : අංක 103/1, කොට්ටාව පාර, විද්‍යාල හන්දිය, හෝකන්දර දකුණ, හෝකන්දර.
සමාගමේ නම : විච්ග්‍රීන් ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 103430
ලියාපදිංචි කාර්යාලය : අංක 103/1, කොට්ටාව පාර, විද්‍යාල හන්දිය, හෝකන්දර දකුණ, හෝකන්දර.
සමාගමේ නම : කිරිනුග ආයුර්වේඩික් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 104019
ලියාපදිංචි කාර්යාලය : සියඹලාගහවත්ත, පල්ලිකුඩාව, තංගල්ල.
සමාගමේ නම : ගෝල්ඩන් වැලි (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පී වී 104323
ලියාපදිංචි කාර්යාලය : අංක 275, බදුල්ල පාර, බණ්ඩාරවෙල.
සමාගමේ නම : හැපි එලිෆන්ට් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 104570
ලියාපදිංචි කාර්යාලය : අංක 3 බී, ඇලෙන්එගොඩ, පමුණුගම, මීගමුව.
04-821

සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බැවි මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නම : ට්‍රිලියන් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2015.04.07
සමාගම් අංකය : පී වී 104978
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 63, රාජාසේවාගම, කොළඹ පාර, අවිස්සාවේල්ල.
අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,
සමාගම් ලේකම්.
04-849

ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කළුතර, දූව පන්සල පාර, ගැමුණු මාවත, අංක 198 ඒ හි පදිංචි නන්දිරත්න බරනාදුගේ දුෂාන්ත කුමාර යන මා විසින් මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. එස්. නෝනිස් මහත්මිය ලියා සහතික කළ අංක 8248 සහ 2014.02.13 දිනැති ඇටර්නි බලපත්‍රයේ සඳහන් සියලුම කාරණා ඉටුකිරීම පිණිස මාගේ ඇටර්නි බලකාරිය ලෙසට පත්කල කන්නන්ගරගේ ප්‍රියංගිකා සඳමාලි ට දෙන ලද ඇටර්නි බලය අද දින සිට අවලංගු සහ බලරහිත කරනු ලබන බවට මහජනයාට මින් දන්වන අතර මාගේ ඇටර්නි බලකාරිය ලෙසට මින් ඉදිරියට ඇය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මම වගකියනු නොලබන බවද ප්‍රකාශ කරමි.
නන්දිරත්න බරනාදුගේ දුෂාන්ත කුමාර.
2015 මාර්තු මස 26 වැනි දින.
04-852

ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් සීමිත වගකීම් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නාමය : සේරම් මැරයින් ෆූඩ්ස් (පීවීටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 104742
ලියාපදිංචි ලිපිනය : අංක 03, ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 05.
සමාගම් ලේකම් : කෝපරේට් සෙක්‍රටීස් ප්‍රැක්ටිස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
04-864

ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංගොඩ, කැළණිමුල්ල, අනුරන්ජන අංක 326 හි පදිංචි කුඩාතන්ත්‍රිගේ හේමන්ත ප්‍රියදර්ශන පෙරේරා වන මා විසින් අංගොඩ, කැලණිමුල්ල, අනුරන්ජන, අංක 326 හි පදිංචි හදා පර්ල් චන්ද්‍රා පෙරේරා යන අය වෙත ප්‍රසිද්ධ නොතාරිස් මාලිනී අශෝකා පෙරේරා විසින් වර්ෂ 2001 සැප්තැම්බර් මස 20 වැනි දින සහතික කරන ලද අංක 15 දරන ඇටර්නි බලය අද පටන් (2015.04.09) අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු පුරවැසියන්ටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට හදා පර්ල් චන්ද්‍රා පෙරේරා යන අය මා නමින් සිදු කරන කිසිදු කාර්යයක් සම්බන්ධයෙන් මා වග නොකියන බව මෙයින් දන්වා සිටිමි.
කුඩාතන්ත්‍රිගේ හේමන්ත ප්‍රියදර්ශන පෙරේරා.
04-863

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

සෙලාන් බැංකුව පීඑල්සී - පිටකොටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපලෙහි බදු අයිතිය කොළඹ 13 හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක පීවී 2057 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ (කලින් ලියාපදිංචි අංක පීවී එස් 6957 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ) යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඩියුරෝ පයිප් ඉන්ඩස්ට්‍රියල් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ ලියනගේමුල්ල ගමේ පිහිටි මිනුම්පති විසින් වලංගු කරන ලද අංක ගම් 563 දරන මූලික සැලැස්මේ ලොට් 1 ලෙස නිරූපනය වන කැකොල්කැලේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සහ තලමිත්කරු ටී. කේ. ධනසේන විසින් සාදන ලද 2000 ජනවාරි මස 28 දිනැති අංක 2419 දරන සැලැස්මේ සඳහන් ලොට් 10 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2419 දරන සැලැස්ම අනුව හෙක්ටයාර් දෙකයි දශම හයයි හතයි පහයි හතක් (හෙක්ටයාර් 2.6757)ක් නොහොත් අක්කර හයයි රූඩ් දෙකයි පර්චස් දාහතයි දශම බිංදුවයි නවයක් (අ. 6, රූ. 2, පර්. 17.09)ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපලෙහි බදු අයිතිය 2015 මැයි මස 15 වැනි දින පෙරවරු 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.- කොළඹ සිට මීගමුව මාර්ගය ඔස්සේ කි. මී. 26 ක පමණ දුරක් ගොස් ලියනගේමුල්ල, ජයලත් මංසන්ධිය හෝ අංක 23/2 දරන බෝක්කුවට පෙර වම්පසට ඇති Y. W. C. A නේවාසිකාගාරය ඇති මාර්ගයට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 400 ක පමණ දුරක් ගිය විට මාර්ගයේ දකුණුපසින් අදාළ දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - රජයේ ගැසට් පත්‍රයේ 2015.03.13 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2015.03.18 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2015.03.06 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ ඡෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. - ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 2456479, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක 011 3068185, 011- 2572940.
04-768

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසිය
(1)

ගම්පොළ දුම්රිය පොළ පාරේ වරිපනම් අංක 47 දරන ස්ථානයේ තබා ඇති ගබඩා කර ඇති සෑම ආකාරයකම චංචල දේපළ "වෙළඳ තොග" වෙළඳ භාණ්ඩ, නිමි භාණ්ඩ, සහ වෙනත් සෑම ආකාරයකම චංචල දේපළ යනාදිය.

ගම්පොළ අඹගමුව පාරේ අංක 230 සහ ගම්පොළ දුම්රිය පොළ පාරේ අංක 47 දරන ස්ථානයේ පිහිටා ඇත්තාවූ "ශ්‍රී ලංකා ස්ටෝර්ස්" තුළ තබා ඇති හෝ ගබඩා කර ඇති ප්‍රීමා තිරිගු පිටි තොග, සහ වෙනත් වියළි ද්‍රව්‍ය, ග්‍රොසරි සහ සිල්ලර උපකරණ සහ සෑම සහ සියළු තොග, වෙළඳ තොග, වෙළඳ භාණ්ඩ සහ නිමි භාණ්ඩ සහ වෙනත් සෑම ආකාරයකම චංචල දේපළ සහ ණයට ගන්නන් විසින් කලින් කල ගෙනෙන ලබන හෝ ඉහත කී පරිශ්‍රය මත ගබඩා කර ඇති හෝ වෙනත් ස්ථානයක තබා ඇති සවිකර ඇති ගබඩා කර ඇති සෑම ආකාරයකම වෙළඳ තොග.

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී නමින් ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් දිලිමිණි ආර්. කේ. සමරතුංග (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.06.11 දිනැති අංක 1233 සහ වර්ෂ 2013.10.30 දිනැති අංක 1307 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අරවින්ද වෙළඳ සංගමය යන නාමය විලාශය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක සහ රත්නායක මුදියන්සේලාගේ නන්දා ගුණතිලක යන අය විසින් පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී වෙළඳ තොග තබා ඇති ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය. - වෙන්දේසිය අවසානයේ දී පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතු ය. (1) සම්පූර්ණ ගැණුම් මුදල (2) වෙන්දේසිකරුගේ ගාස්තුව 2 1/2% ක් (3) වෙන්දේසිය සඳහා දරන්නට වූ සියලුම වියදම් (4) ඡෝෂක හා ලිපිකරු ගාස්තු රු. 3,000, (5) විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 7,500 ක් ද වේ.

(2) සම්මුතියේ III කොටසේ සඳහන් දේපළ ගම්පොළ දුම්රිය පොළ පාරේ වරිපනම් අංක 47 දරන පරිශ්‍රයේ පිහිටා ඇති ගොඩනැගිලි යනාදිය සතු කල්ගත නොවූ වසර 06 ක බදු අයිතිය සමග පර්චස් 1.85 විශාලැති අගනා දේපළ 2013.08.06 වැනි දින බලයලත් මිනින්දෝරු එස්. එම්. අබේරත්න විසින් සාදන ලද අංක 1112 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන ගම්පොල දුම්රිය පොළ පාරේ වරිපනම් අංක 47 දරන පරිශ්‍රය සහ ඒ තුළ පිහිටා ඇති සෑම සහ සියලු ගොඩනැගිලි යනාදී ප්‍රමාණයෙන් පර්චස් 1.85 ක් විශාලැති දේපළ සතු වන්නාවූ කල්ගත නොවූ වසර 06 ක බදු අයිතිය.

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී නමින් ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් දිලිමිණි ආර්. කේ. සමරතුංග (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.06.11 දිනැති අංක 1231 සහ වර්ෂ 2013.10.30 දිනැති අංක 1305 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අරවින්ද වෙළඳ සංගමය යන නාමය විලාශය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක, මුදුන්කොටුවේගෙදර සුසිල් ප්‍රේමපුෂ්ප ගුණතිලක සහ රත්නායක මුදියන්සේලාගේ නන්දා ගුණතිලක (ණයට ගන්නන්) විසින් පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපල වල කල්ගත නොවූ වසර 06 ක බදු අයිතිය 2015 ක් වූ මැයි මස 14 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත කී දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය. - ගම්පොල නගර මධ්‍යයේ සිට නුවරඑළිය පාර ඔස්සේ (දුම්රිය පොල පාර නමින්ද හැඳින්වේ.) මීටර් 500ක් පමණ ගමන් කිරීමෙන් වරිපනම් අංක 47 දරන පරිශ්‍රය හමුවේ.

(3) සම්මුතියේ II කොටසේ සඳහන් දේපළ

ගම්පොල උඩපළාතේ ගඟ ඉහළ කෝරළේ දේශීය අධිකාරී ප්‍රදේශය තුළ වූ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇත්ගාල උතුරු ග්‍රාමසේවා කොට්ඨාස අංක 1073 තුළ වූ සිංහපුර ඇත්ගාල ගම පිහිටි මරියවත්ත එස්ටේට්හි ඇත්ගාල කොට්ඨාසය යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට පිඹුරු අංක 4218 හි සඳහන් වන්නාවූ කැබලි අංක A දරන පර්චස් 27.17 ක් විශාලැති අගනා කෘෂිකාර්මික දේපළ.

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී නමින් ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් දිලිමිණි ආර්. කේ. සමරතුංග (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.06.11 දිනැති අංක 1231 සහ වර්ෂ 2013.10.30 දිනැති අංක 1303 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අරවින්ද වෙළඳ සංගමය යන නාමය විලාශය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක, මුදුන්කොටුවේගෙදර සුසිල් ප්‍රේමපුෂ්ප ගුණතිලක සහ රත්නායක මුදියන්සේලාගේ නන්දා ගුණතිලක (ණයට ගන්නන්) විසින් පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ 2015 ක් වූ මැයි මස 14 වැනි දින ප. ව. 12.00 ට ඉහත කී දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.- ගම්පොල නගර මාධ්‍යයේ සිට නාවලපිටිය පාර ඔස්සේ කි. මී. 4.8ක් පමණ ඇත්ගාල මංසන්දිය දක්වා ගමන් කොට (උප තැපැල් කාර්යාලය මදක් පසුකර) වමට හැරී බංගලාව පාර ඔස්සේ මීටර් 15ක් පමණ ගමන් කර නැවත දකුණට හැරී දුන්නිද පාරේ මීටර් 800ක් පමණ ගමන් කිරීමෙන් මෙම පාරට මුහුණ ලා මෙම දේපල පිහිටා ඇත.

සම්මුතියේ I කොටසේ සඳහන් දේපළ

වැලිමඩ කැප්පෙටිපොල ගවරමාන ග්‍රාමයේ පිහිටි අක්කර 02යි, රූඩ් 03යි, පර්චස් 32.1ක් විශාලැති අගනා කෘෂිකාර්මික දේපළක් ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයෙහි උඩුකින්ද උඩපළාත කෝරළේ වැලිමඩ කැප්පෙටිපොල පළාත් පාලන ආයතනය තුළ ගවරමාන ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ නිළල්ලේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් 2008.08.18 වැනි දින මැන සකස් කරන ලද අංක 3533ඒ දරන පිඹුරේ කැබලි අංක 1ඩී සහ

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයෙහි, උඩුකින්ද උඩපළාත කෝරළේ වැලිමඩ කැප්පෙටිපොල පළාත් පාලන ආයතනය තුළ ගවරමාන ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ නිළල්ලේවත්ත සහ නිළෙල්ලේහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් 2008.08.18 වැනි දින මැන සකස් කරන ලද අංක 3533 බී දරන පිඹුරේ කැබලි අංක 1.

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී නමින් ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් දිලිමිණි ආර්. කේ. සමරතුංග (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.06.11 දිනැති අංක 1231 සහ වර්ෂ 2013.10.30 දිනැති අංක 1303 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අරවින්ද වෙළඳ සංගමය යන නාමය විලාශය සහ ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක, මුදුන්කොටුවේගෙදර සුසිල් ප්‍රේමපුෂ්ප ගුණතිලක සහ රත්නායක මුදියන්සේලාගේ නන්දා ගුණතිලක (ණයට ගන්නන්) විසින් පැහැර ඇති බැවින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ 2015ක් වූ මැයි මස 14 වැනි දින ප. ව. 2.00 ඉහත කී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය. - කැප්පෙටිපොල නගරයේ සිට නුවරඑළිය දෙසට නුවරඑළිය පාර ඔස්සේ කි. මී. 1.5ක් පමණ ගමන් කොට දකුණට හැරී කොහිලගොල්ල පාරේ කි. මී. 1.5 පමණ ගමන් කිරීමෙන් පාරේ දකුණු පසින් පිහිටි මෙම දේපළට ප්‍රවිශ්ඨ විය හැකි ය. වැඩිදු විස්තර සඳහා 2015.04.02 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය ද, 2015.03.20 වැනි දින "ද අයිලන්ඩ්" "දිවයින" සහ "තිනකුරල්" පුවත්පත් බලන්න.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතු ය. (1) ගැණුම් මිලෙන් 10% ක මුදලක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද සහ වැට් බද්ද (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ ඡෝෂක ගාස්තු වශයෙන් රු. 3,000 ක් ද, ගෙවිය යුතු වන අතර විකුණුම් මිළේ පරිශේෂය වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ඉහත කී බැංකුවේ තැන්පත් කළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02 නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448. 0117 448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා වරලත් වෙන්දේසිකරු.
අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777- 672082 ෆැක්ස් : 2871184.
04-732

හලාවත දිසා අධිකරණය

සංශෝධිත වෙන්දේසි දැන්වීම

2015.04.02 වැනි දින අංක 1909 දරන ගැසට් පත්‍රයේ I කොටස : II (ඇ) ඡේදය වෙන්දේසි කිරීම් පිළිබඳ යටතේ 04-167 නිවේදනයට පහත සඳහන් සංශෝධන ඇතුලත් කරනු ලැබේ.

කොළඹ 01 බ්‍රිස්ටල් වීදියේ අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී එල් සී
.....පැමිණිලිකරු.
එදිරිව
පැනිරැන්දාව ඌරලිය මැදගම වතුයායේ අංක 116 දරන ස්ථානයේ ජයසිංහ ආරච්චිගේ අමිල් නිශාන්ත විත්තිකරු
.....විත්තිකරු.

නඩු අංකය : 4274/MB /12

2 වැනි උපලේඛනයේ සඳහන් එරැන්විල ග්‍රාමයේ පිහිටි ඉඩම (අ. 0 රූ. 1 පර්. 30) වර්ෂ 2015ක් වූ මැයි මස 15 වැනි දින පෙ. ව. 11.00 ට 1 වැනි උපලේඛනයේ සඳහන් ඌරලිය සහ මැදගම පිහිටි ඉඩමේ (අ. 0 රූ. 0 පර්. 20) වර්ෂ 2015ක් වූ මැයි මස 15 වැනි දින ප. ව. 2.00 ට ඉහත ස්ථාන වලදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසි දැන්වීමේ 2 වැනි උපලේඛනයේ සඳහන් ඉඩමේ ප්‍රමාණය වැරදි ලෙස සඳහන් වී ඇත. එය මෙසේ නිවැරදි විය යුතුයි. 2 වැනි උප ලේඛනයේ සඳහන් එරැන්විල් ග්‍රාමයේ පිහිටි ඉඩම (අ. 0 රූ. 3 පර්. 30) ලෙස සඳහන් විය යුතුයි.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත අයගෙන් විමසන්න.
එල්. බී. සේනානායක,
සාම විනිසුරු බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු සහ උසාවි කොමසාරිස් වානිජමහාධිකරණ සහ කොළඹ දිසා අධිකරණයේ සහ ගාල්ල දිසා අධිකරණයේ බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය හා වාණිජ බැංකු අංක 200, 2 වැනි මහල
උසාවි පාර, කොළඹ 02.
දුරකථන අංක : 011 2396520.
සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥ සහ නොතාරිස්වරු,
අංක 810, 2 මහල, මරදාන පාර,
කොළඹ 12
දුරකථන අංක : 011 - 2672262, 011 2672263
ෆැක්ස් අංකය : 011 2683073.
04-817

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - පානදුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර නගර සභා සීමාවේ, නල්ලුරුව ශ්‍රී ඥානරත්න මාවත දිගේ (කොට්ඨාස අංක 4 උයන් කැලේ) නල්ලුරුව (කොට්ඨාස අංක 5 මෝදරවිල) කඵදෑවල (කොට්ඨාස අංක 5 මෝදරවිල) සහ වැකඩ (කොට්ඨාස අංක 5 මෝදරවිල) පිහිටි මෝදරවිල අරමුණුගහවෙල කැටකැලගහවත්ත සහ අරමුණුගහකුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් 1992 අගෝස්තු මස 14 වැනි දින සාදන ලද පිඹුරු අංක 939 හි ලොට් 15 දරන ප්‍රමාණය අක්කර එකයි පර්චස් දාහතයි දශම එකයි හයක් (අ. 1, රූ. 0, පර්. 17.16) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගසකොළ වගාවන් සහ සියලු දේත් සමග වේ.

පහත සඳහන් ඉඩම මතුපිටින් ගමන් කිරීමේ අයිතිය ද සමග වේ.

ඉහත සඳහන් ශ්‍රී ඥානරත්න මාවත දිගේ පිහිටා ඇති මෝදරවිල අරමුණුගහවෙල කැටකැලගහවත්ත සහ අරමුණුගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. පී. චන්ද්‍රසේකර විසින් 1992 අගෝස්තු මස 14 වැනි දින සාදන ලද පිඹුරු අංක 939 ලොට් 5 දරන (පාරක් සඳහා වෙන්කරන ලද)

ප්‍රමාණය : අක්කර එකයි පර්චස් තිස්පහයි දශම නවයයි එකක් (අ 1. රූ. 0 පර්. 35.91) පානදුර ගුණරත්න මාවතේ අංක 3 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වූ අයි. ඊ. ටෙක්නික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2015ක් වූ මැයි මස 19 වැනි දින පෙ. ව. 11.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.04.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2014.09.24 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.04.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.04.27 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම. - පානදුර නගර මාධ්‍යයේ ඇති ඔරලෝසු කණුව ලඟසිට කොළඹ - ගාල්ල ප්‍රධාන පාරේ ඔස්සේ ගාල්ල දෙසට කි. මී. 1.3ක් ගමන් කළ විට කර්මාන්තශාලා හංදිය හමුවේ. එම හංදියේ වමට ඇති ශ්‍රී ගුණරත්න මාවතේ මීටර් 400ක් ගොස් වමට හැරුණු විට අඩි 30 පළල වාහන ගමන් කළ හැකි නගර සභා පාරේ මීටර් 250ක් ගිය විට අදාල දේපළ වන වරිපනම් අංක 45/5 වම් අත පැත්තේ පිහිටා ඇත. (ඊට විරුද්ධ පසින් අංක 3 දරන කොරියන් ස්පා කර්මාන්තශාලාව පිහිටා ඇත)

ගෙවීමේ ක්‍රමය. -විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000 (05) ලිපිකරු හා සෝෂක චේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් අකාලීත වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතු ය. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ පානදුර ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු උසාවි කොමසාරිස්,
අංක 182, 3 වැනි මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් : 011 - 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 375,
ගාළු පාර, පානදුර.
දුරකථන 038 - 2236808,
ෆැක්ස් අංකය : 038 - 2234167.
04-722

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී - මිගමුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, 61 ඒ, ආඩිමුල්ල ග්‍රාම නිලධාරී වසමේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ අළුත්කුරු කෝරළේ, දුන්ගහපත්තුවේ, ආඩිමුල්ල ග්‍රාමයේ පිහිටි "මිල්ලගහකුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් 2004 ජනවාරි මස 06 වැනි දින සාදන ලද අංක 6772 දරන පිඹුරේ දැක්වෙන ඉඩම් කොටසට රූඩ් දෙකයි පර්චස් පහළොවයි දශම බිංදුවයි (අ. 0, රූ. 2, පර්. 15.0) ක හෙවත් හෙක්ටයාර් 0.03794 විශාල ඉඩම සහ ඒ තුළ ඇති සියලු දේත් සමග වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ 61 ඒ, ආඩිමුල්ල ග්‍රාම නිලධාරී වසමේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ අළුත්කුරු කෝරළේ, දුන්ගහපත්තුවේ ආඩිමුල්ල ග්‍රාමයේ පිහිටි "මිල්ලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් 2010 දෙසැම්බර් මස 31 වැනි දින සාදන ලද අංක 1730 ඒ දරන පිඹුරේ දැක්වෙන ඉඩම් කොටසට පර්චස් විසිපහ (අ. 0, රූ. 0, පර්. 25) ක හෙවත් හෙක්ටයාර් 0.06323 විශාල ඉඩම සහ ඒ තුළ ඇති සියලු දේත් සමග වේ.

පින්නල වත්තගේ දොන් අලේෂ් ශාමල් කුමාර යන අය ණයකරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2015 ක් මැයි මස 22 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.12.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.04.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.04.24 වැනි දින ලක්බිම ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම. - කොච්චිකඩේ නගරයේ සිට මඩම්පැල්ල පාරේ කිලෝමීටර් 6 කණුව පසුකර මීටර් 350ක් පමණ ගොස් රෝමානු කතෝලික පල්ලිය පසුකර මීටර් 150ක් පමණ ගිය විට අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය. -විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000 (05) ලිපිකරු හා සෝෂක චේතනය රු. 500 (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතු ය. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ මීගමුව ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු උසාවි කොමසාරිස්,
අංක 200, 2 වැනි මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් : 011 - 2445393,
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී,
අංක 24 - 26 ප්‍රනාන්දු ඇවනියු,
මීගමුව.
දුරකථන 031 - 2222217,
031 - 2233955
ෆැක්ස් අංකය : 031 - 2227109.
04-723

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳව දැන්වීම

ණය අංකය : 6/43474/H6/891, 6/48186/ F6/769.

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා අයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.05.14 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2014.05.26 වැනි දින දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉහිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, විය හියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ල, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2015.05.27 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ තල්පිටි දෙබැද්ද පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ මාලමුල්ල පිහිටි "මාලමුල්ල එස්ටේට්" නමැති ඉඩමට 2001.03.15 වැනි දින බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් මැන සකසන ලද අංක 3213 දරන පිඹුරේ කැබලි අංක 7 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 0, පර්. 8 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 417/61 යටතේ ලියාපදිංචි වී ඇත. තවද, ඉහත පිඹුරේ කැබලි අංක 6 හා 13 දරන කොටස් මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
වැඩලන සාමාන්‍යාධිකාරිණී.

2015 අප්‍රේල් මස 09 වැනි දින,
අංක 269, ගාළු පාර කොළඹ 03.
04-845

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 85

MOD/DEF/10/03/PRO/S.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම් පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර එයාර් වයිස් මාර්ෂල් නිලයට උසස් කෙරේ :

තාවකාලික එයාර් වයිස් මාර්ෂල් ලොකුගත් හේවගේ අජන්ත සිල්වා (01382) කාර්මික/ඉංජි - 2015.01.01 ;

තාවකාලික එයාර් වයිස් මාර්ෂල් චන්දන ප්‍රභාත් වැලිකල (01396) පරිපාලන - 2015.01.01;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.
04-728

2015 අංක 86

MOD/DEF/10/03/PRO/IT.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම් පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ :

ෆ්ලයිට් ලෙෆ්ටිනන් අභයසිංහ ආරච්චිගේ මාධව ප්‍රසන්න කුමාර අභයසිංහ (02398) සැපයුම් - 2014.09.16 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් ගොඩකුඹුරේ ගෙදර නිහාල් චන්ද්‍රජිත් ගොඩකුඹුර (02599) ගු. තො. නි - 2015.01.01 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් සුරාජ් චින්තක මඩුවල (02606) පරිපාලන - 2015.01.01 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් හෙට්ටිආරච්චිගේ දොන් තුසර නුවන් සුරංග (02401) සැපයුම් - 2015.01.01 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් කොණ්ඩසිංහ රාජකරුණා රාජමන්ත්‍රීලාගේ නිශාන්ත පුෂ්පකුමාර (02558) කාර්මික/ඉංජි - 2015.01.01 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් උදිත ඉෂාර අද්දර පතිරණ (02573) පරිපාලන/රෙජි - 2015.01.01 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් වීරසිංහ ආරච්චිගේ සුරේෂ් රංගන වීරසිංහ (02616) පරිපාලන/රෙජි - 2015.01.06 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් මනම්පේලි මහපටබැදිරාලලාගේ සුරංග නාමල් කුරේ වනිගරත්න (02617) පරිපාලන/රෙජි - 2015.01.06 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් රංගන විනෝද් ජයසිංහ (02663) (නි.පො.රා.) - 2015.01.06 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් වීබැද්දේ අධිකාරම් මුදියන්සේලාගේ බුද්ධි නන්දන බණ්ඩාර වීබැද්ද (02664) නි. පො. රා. - 2015.01.06 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් ඉෂාන් සමීර බණ්ඩාර තිබ්බොටුමුණුවේ (02665) නි. පො. රා. - 2015.01.06 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් දොන් ලක්ෂිත කොළඹගේ (02666) නි. පො. රා. - 2015.01.06 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් වාද්දුවගේ උපුල් පුෂ්ප කුමාර පෙරේරා (02601) ගු. තො. නි. - 2015.01.14 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් හෙට්ටිආරච්චිගේ සුගත් ඉරෝෂන් අබේවර්ධන (02965) ගු. තො. නි. - 2015.03.22 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් සුදේශ් චාමර වනිගසිංහ (02944) විද්‍යුත්/ඉංජි - 2015.03.23 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් උඩුවරගේ දොන් මංජුල පුෂ්පකුමාර (02946) විද්‍යුත්/ඉංජි - 2015.03.23 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් හපු ආරච්චිල්ලාගේ මෙනෝකා ජයමාලි හපුආරච්චි (02947) ගු. තො. නි. - 2015.03.23 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් තෙල්ලඹුර හෙට්ටි ආරච්චිගේ ලහිරු හසන්ත හෙට්ටිආරච්චි (02949) ගු. තො. නි. - 2015.03.23 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් උඩගේ මුදියන්සේලාගේ සුදත් බණ්ඩාර ආරියරත්න (02950) ගු. තො. නි. - 2015.03.23 ;

ෆ්ලයිට් ලෙෆ්ටිනන් දිසානායක මුදියන්සේලාගේ එරන්ද ධනුෂ්ක ගුණරත්න (02945) විද්‍යුත්/ඉංජි - 2015.04.23 ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

04-727

රජයේ නිවේදන

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

තනතුරු විශ්‍රාම වැටුප් හිමි තනතුරු වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ ගැසට් නිවේදනය අවලංගු කිරීම

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත අනුව පිහිටුවන ලදුව 1996 අගෝස්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II කොටසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිත්‍ය කාර්ය මණ්ඩලයේ තනතුරු එදින සිට බලපැවැත්වෙන පරිදි විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 2 වගන්තිය ප්‍රකාර හා එම විධිවිධානවලට අනුකූලව විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශයට පත් කිරීම සඳහා මවිසින් 2012 ජනවාරි මස 13 වැනි දින අංක 1741 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *සාමාන්‍ය ගැසට් පත්‍රයේ* I කොටස (I) ඡේදයෙහි පළකරන ලද *ගැසට් නිවේදනය* අවලංගු කරන බව මෙයින් ප්‍රකාශයත් පත් කරනු ලැබේ.

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය.

2015 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය
පාලනය පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.
04-720

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/21/2015/පිටු/සැ.

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් සභාධිපත්‍ය දේපළ සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති සභාධිපත්‍ය දේපළ ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.04.24 වැනි දින සිට 2015.05.08 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයකුට ඉහත කී තාවකාලික පිටුව හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.05.15 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

ලියාපදිංචි පොත්වල කැඩිබිඳී ඇති පිටුවල විස්තර	*ඉඩම්වල විස්තර*	*ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර*
කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, කේ කොට්ඨාසයේ 82 වෙළුමේ 106 පත් ඉරුව	බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කුඹුකේ පත්තුවේ, රයිගම් කෝරළයේ ගොඩිගමුවේ පිහිටි "මාරගහේන" නමැති ඉඩමට බලයලත් මානක එම්. ඩී. ඒ. ගුණතිලක මහතා විසින් මැන සාදනලද අංක 699 දරන පිඹුරේ ඒකක සී සඳහා මායිම්, *උතුරු-නැගෙනහිරට* : දොන් ඩේවිඩ්ට අයත් හඳුන්පොඩි ඇල දෙනිය ද, *දකුණු-නැගෙනහිරට* : දොන් ඩේවිඩ්ට අයත් මෙම ඉඩමේ කොටස ද, *දකුණු -බස්නාහිරට* : පාරකට ඉතිරිකළ බිම් තීරය ද, *උතුරු-බස්නාහිරට* : මෙම ඉඩමේ බී අක්ෂරය දරන කොටස. බිම් ප්‍රමාණය : අ. 03, රූ. 00, පර්. 00	01. එච්. ඩී. සී. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1945.01.18 දින අංක 17439 දරන විකුණුම්කරය

04-711

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/17/2015/පිටු/සැ.

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.04.24 වැනි දින සිට 2015.05.01 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයකුට ඉහත කී තාවකාලික පිටුව අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.05.08 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

උපලේඛනය

ලියාපදිංචි පොත්වල කැඩිබිඳී ඇති පිටුවල විස්තර	*ඉඩම්වල විස්තර*	*ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර*
ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එෆ් දරන කොට්ඨාසයේ 222 වෙළඹේ 36 පත් ඉරුව	බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, උඩුගහ පත්තුවේ, නිට්ටඹුව පිහිටි "කෝන්ගහවත්ත " නමැති ඉඩමේ අංක 03 දරන කැබැල්ලට බලයලත් මානක පී. ජයකොඩි විසින් 1992.09.18 දින මැන සාදන ලද අංක 308 පිඹුර ප්‍රකාර මායිම්, *උතුරු-නැගෙනහිරට* : කැබලි අංක 02, *දකුණු-නැගෙනහිරට* : මහනුවර දක්වා ප්‍රධන පාර *දකුණු-බස්නාහිරට* : ඩී. ඒ. පියදාසට අයත් ඉඩම *උතුරු-බස්නාහිරට* : එස්. කේ. ඩී. ප්‍රේමසිංහට අයත් ඉඩම ප්‍රමාණය : අ. 01, රූ. 01, පර්. 12.122	01. ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1999.12.16 දින ලියා සහතික කරන ලද අංක 18011 දරන උකස්කරය. 02. ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2002.08.08 දින ලියා සහතික කරන ලද අංක 20416 දරන උකස්කරය.
ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එෆ් දරන කොට්ඨාසයේ 222 වෙළඹේ 228 පත් ඉරුව	බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, උඩුගහ පත්තුවේ, නිට්ටඹුව පිහිටි "කෝන්ගහවත්ත " නමැති ඉඩමේ අංක 03 දරන කැබැල්ලට බලයලත් මානක පී. ජයකොඩි විසින් 1992.09.18 දින මැන සාදන ලද අංක 308 පිඹුර ප්‍රකාර මායිම්, *උතුරු-නැගෙනහිරට* : කැබලි අංක 02, *දකුණු-නැගෙනහිරට* : මහනුවර දක්වා ප්‍රධන පාර *දකුණු-බස්නාහිරට* : ඩී. ඒ. පියදාසට අයත් ඉඩම *උතුරු-බස්නාහිරට* : එස්. කේ. ඩී. ප්‍රේමසිංහට අයත් ඉඩම ප්‍රමාණය : අ. 01, රූ. 01, පර්. 12.122	01. ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2003.10.20 දින ලියා සහතික කරන ලද අංක 21141 දරන උකස්කරය. 02. ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2004.01.29 දින ලියා සහතික කරන ලද අංක 21376 දරන උකස්කරය.
ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එෆ් දරන කොට්ඨාසයේ 222 වෙළඹේ 244 පත් ඉරුව	-එම-	01. පී. එන්. ඒකනායක ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2005.12.27 දින ලියා සහතික කරන ලද අංක 5248 දරන උකස්කරය. 02. පී. එන්. ඒකනායක ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2007.02.22 දින ලියා සහතික කරන ලද අංක 5958 දරන උකස්කරය
ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, එෆ් දරන කොට්ඨාසයේ 222 වෙළඹේ 256 පත් ඉරුව 04-805	-එම-	02. පී. එන්. ඒකනායක ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2008.04.30 දින ලියා සහතික කරන ලද අංක 6786 දරන උකස්කරය.

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk